# ගොවි ජනතාවයි වාරි ක්‍රමයයි

වාරිමාර්ග පද්ධතියත් ගොවියාත් අතර කිට්ටු සම්බන්ධතාවයක් ගොඩ නගා ගැනීම ගැන කථාකරන මේ යුගයේ මේ ගැටළුව කෙරෙහි තරමක් වෙනස් ඇසකින් බැලීමයි මේ කුඩා ලිපියේ අර මුණ. "වාරිමාර්ග පද්ධතිය ඔබේය, එය ආරක්ෂා කරගැනීම සහ නඩත්තු කිරීම ඔබ සතු වගකීමයි" හැම අතින්ම කියනු අසේ එහෙත් ගොවීහු එදා මෙන් අදත් ඔවුන්ගේ හැසිරීම වෙනස්කල බවක් පැහැදිලිව දකින්නට නැත.

වාරිමාර්ග ජල පාලනයේදීත්, පද්ධති නඩත්තු කරගෙන යාමේදීත් ගොවියාගේ සාමාන්‍ය හැසිරීම නම් වාරි පද්ධති යට පිටස්තර කෙනෙකු ලෙස තමා සලකා කටයුතු කිරීමයි. ඔහු සිතන්නේ වාරිපද්ධතිය රජයට අයත් එකක් බවත්, එය නඩත්තුව හා ආරක්ෂාව රජයේ වගකීමක් බවත් ය. එහෙත් තමා අවශ්‍යයෙන්ම වාරි පද්ධතියේ පහසුකම් භුක්ති විඳීමේ අයිතිය ඇත්තකු ලෙසද, සලකන බවක් පෙනේ. කෙසේ වුවද වැඩි කාර්යක්ෂමතාවයකින් පද්ධති නඩත්තු කිරීමට, පද්ධතිය හා ගොවියා අතර ඇති මේ දුරස්ථ සම්බන්ධතාව වඩා සමීප සම්බන්ධතාවයක් විය යුතුමය. එනම් වාරිපද්ධතිය ඔහුට අයත් එකක්ය, යන ආකල්පය ගොවියා තුළ ඇතිවිය යුතුය.

මේ ගැටළුවේදී වැඩි සැලකිල්ලක් යොමුකළ යුතුව ඇත්තේ ගොවීන් වාරි පද්ධතිය තමාට අයිති එකක් සේ නොසිතන්නේ ඇයිද කියා සොයා බැලීමටයි. එසේ සොයා බැලීමෙන් පමණයි, ගොවීන් තුළ ආකල්ප වෙනසක් ඇති කිරීමට කටයුතු සම්පාදනය කළ හැක්කේ.

කිසිවකු කිසිවක් තමාගේ යයි කියන්නේ ඇයි? ඔහු එසේ කියන්නේ එය තමාගේ යයි හැඟෙන තත්ත්වයන් ඇතිවන නිසා යයි සිතිය හැකිය, තමාගේ යැයි හැඟෙන්නේ කුමන තත්ත්වයන් නිසාද?

බොහෝ ගැඹුරින් කල්පනා කරන විට තමාගේ යයි කියන ඕනෑම දෙයක හිමිකම පිළිබඳව කිසිවෙකුට ගැඹීමක් ඇතිවන්නේ ඔහු හා එම වස්තුව අතර ඇති සමීපකම නිසා බව පැහැදිලි වේ. මේ සමීපකම තීරණය කරන කරුණු හේතු කොට ගෙන හිමිකම හෝ අයිතිය පිළිබඳව පුද්ගලයාට හැඟීමක් ලබාදෙන බව පෙනේ. මේ කරුණු අතර,

අ. අදාල වස්තුව පාලනය කිරීමේ අයිතිය

ආ. ඒ හා සම්බන්ධ කටයුතුවලදී තීරණය ගැනීමේ අයිතිය.

ඇ. වෙනස් කිරීමේ අයිතිය.

ඈ. භුක්ති විඳීමේ හෝ ප්‍රයෝජන ගැනීමේ අයිතිය.

ඉ. අදාල වස්තුව පිළිබඳව ඔහු තුල ඇති දැනුවත්කම හා විස්තර කිරීමේ හැකියාව.

ඊ. පුද්ගලිකව තමා මුදලින් හෝ ශ්‍රමයෙන් පිරිවැයක් දරා තිබීම හෙවත් තමාගේ සහභාගීත්වය යම් අයුරකින් අදාල දෙය තුලට ගැබ්ව ඇතැයි යන විශ්වාසය.

උ. තමාගේ බලපෑමට වඩා වැඩි බලපෑමක් පිටස්තරයන්ට අදාල වස්තුව කෙරෙහි කළ නොහැකි යයි පුද්ගලයා තුළ ඇති විශ්වාසය ආදී කරුණු ප්‍රධාන තැනක් ගනු ලබන බව පෙනේ.

අයිතිය පිළිබඳව අවශ්‍ය හැඟීමක් ඇතිවන විට පුද්ගලයා විසින් අදාල වස්තුව කෙරේ දක්වන ප්‍රතිචාර වලද යම් යම් හඳුනාගත හැකි ලක්ෂණ ඇත. මේ ප්‍රතිචාර බොහෝවිට ශුභවාදී ප්‍රතිචාර විනා අදාල වස්තුව කෙරෙහි කිසියම් හානියක් බාධාවක් හෝ පිරිහීමක් ඇති කිරීමට හේතුවන අශුභවාදී ප්‍රතිචාරයක් නොවේ. තමාගේය යන හැඟීම ඇති පුද්ගලයා,

**අදාල වස්තුව නඩත්තු කිරීමට හා ආරක්ෂා කිරීමට පෙළඹෙයි.**

**හැමවිටම හිතකර තීරණ පමණක් ගැනීමට පෙළඹෙයි.**

**පිටස්තර උවදුරු වලක්වයි.**

වාරිමාර්ග පද්ධතියක් සම්බන්ධ වුවද, මේ කරුණු මේ ආකාරයෙන්ම සාධාරණවේ. පද්ධතිය ගොවියාගේ යයි ඔහු සිතන්නේ අප මුලින් කී කරුණු සහිත තත්ත්වයක් වාරිමාර්ග පද්ධතිය සම්බන්ධයෙන් දැකිය හැකි නම් පමණි. එහෙත් සැබෑ තත්ත්වය නම් මුලින් දැක්වූ තත්වයත්, පසුවදැක්වූ ප්‍රතිවාර තත්ත්වයත් යන දෙකම වාරිමාර්ග පද්ධතියකදී දැකිය නොහැකි බවයි. එනම් ගොවීන් වාරි පද්ධතිය ඔවුන්ගේ යැයි නොසිතනවා පමණක් නොව ඒවා ආරක්ෂා කිරීමට තරම් උනන්දුවක් ද දක්වන්නේ නැත.

**පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි**

**අයි. රණසිංහ පෙරේරා විසිනි**

දැන් අපට සලකා බැලීමට ඇත්තේ වසර දහස් ගණනක් පැවති වාරිමාර්ග ශිෂ්ටාචාරයක් තිබූ ශ්‍රී ලංකාවේ මේ දුරස්ථරකම ඇතිවී තිබෙන්නේ ඇයිද යන්නයි. හේතුව මෙයයි. ඉතිහාසයේදී වාරිමාර්ග සැලසුම් කලේ ගොවීන්ය. නිර්මාණ කලේ ගොවීන්ය. නඩත්තු කලේ ගොවීන්ය. තීරණ ගනු ලැබුවේ ගොවීන්ය. එමෙන්ම වගා කටයුතු කලේද ගොවීන්මය. මේ නිසා එදා වාරි පද්ධතිය ගොවීන් විසින් නිර්මාණය කරන ලද හා පාලනය කරන ලද වස්තුවක් නිසා එය ඔවුන්ගේ බව අන් අයකු විසින් ඔවුන්ට පැහැදිලි කරදීමක් අවශ්‍ය නොවීය. මෙහි ප්‍රතිඵලයක් ලෙස පැරණි ගොවීහු ඔවුන් පෝෂණය කළ වාරිපද්ධති නඩත්තු කලහ. ආරක්ෂා කලහ. ඓතිහාසික තොරතුරු අනුව කිසිවිටෙක පද්ධති කඩාබිඳ දැමීමට කටයුතු කල බවක් හෝ නඩත්තු කිරීම් නොසලකා හැරී බවක් හෝ පොදු වශයෙන් දකින්නට නැත. එහෙත් මෑත යුගය වනවිට වෙනස් වූ දේශපාලන, ආර්ථික හා සමාජ රටාව නිසා පැරණි වාරි ශිල්ප ක්‍රමත්, පරිපාලන ක්‍රමත් මෙන්ම ගොවියා හා වාරි පද්ධතිය අතර තිබූ සම්බන්ධතාවත් පිරිහී ගියේය. අළුත් තත්වය යටතේ බටහිර වාරි ශිල්පක්‍රම පැමිණී අතර වාරි ක්‍රම සැලසුම් කිරීමත්, නිර්මාණයත්, පරිපාලනයත්, තීරණ ගැනීමත් ගොවියාගෙන් මුළුමනින්ම ස්වාධීන වූ නව ආයතන ව්‍යුහයකට පැවරුණ. වාරිමාර්ග ඔස්සේ මෙ වෙනස්කම කොතෙක් ඇති වුවද ක්වහොත් මෙරට තුළ තවමත් දේශීය සම්ප්‍රදායට නැකම් කියන වෛද්‍ය ක්‍රම කලාශිල්ප හා වෙනත් ශිල්පීය වෘත්තීන් ඇතත් අපට දේශීය යයි කිවහැකි වාරි ශිල්පවෘත්තියක් ඇත්තේම නැත. අළුත් තත්වය යටතේ ගොවියාත් වාරි පද්ධතියත් මුළුමනින්ම වෙන් වූ ආයතන දෙකකි. මේ වෙනස්වීම නිසා ගොවීන්ගේ ප්‍රතිචාර රටාවද වෙනස් වී තිබේ. ඓතිහාසික යුගවලදී මෙන් නොව දැන් ගොවියා මුළුමනින්ම පද්ධතියෙන් ස්වාධීන වූවකු නිසා ඔහුට පද්ධතිය පිළිබඳව තිබෙන දැනුවත්කම අඩුය. බොහෝ වාරිමාර්ග නිර්මිත කුමන කාර්යයක් සඳහා නිර්මාණය කරන ලදැයි ඔහු නොදනී. මේ නිසා අප මුලින් කී තමාගේ වස්තුවක් යයි හැඟීමක් පුද්ගලයාට ගෙනදීමට හේතුවන "දැනුවත්කම හා විස්තර කිරීමේ හැකියාව" ගොවියාට නැත. මෙසේ වී ඇත්තේ ගොවියා වාරිමාර්ග සැලසුම්කරණයක් හා නිර්මාණ කටයුතු වලින් මුළුමනින්ම පිටස්තරයකු බවට පත්වී ඇති බැවිනි. වාරිමාර්ග පාලනය, කළමණාකරණ හා තීරණ ගැනීම සම්බන්ධයෙන්ද ගොවියා අප්‍රධානයකු වී ඇති නිසා ඒ තුළින්ද පද්ධතිය ඔහුගේ යැයි හැඟීමක් ඇති නොවේ. ගොවියා තමාගේ ධනයෙන්, ශ්‍රමයෙන් හෝ කාලයෙන් පද්ධතිය සඳහා කිසියම් පිරිවැයක් දරා නැති නිසාද, වාරිපද්ධතිය ඔහුට අයත් දෙයක් සේ සැලකීමක් නොකෙරේ. මේ විවිධ හේතු නිසා වාරි පද්ධතිය රජයේය, ගොවීහු පිටස්තරයෝ වෙති.



ගොවීන් පිළිබඳ සාකච්ඡාවක්

මේ දුරස්ථර සම්බන්ධතාව මෙසේ පවතිද්දී කිසියම් පිටස්තර සම්පතක් පෞද්ගලික අභිමතාර්ථ සඳහා පොදුවේ පාරිභෝජනය කිරීමට යාමේදී ඇතිවන අසමාන තත්ත්වය සලකා බැලීම අවශ්‍යයෙන්ම කළ යුත්තකි. උදාහරණයක් වශයෙන් වාරිමාර්ග ජලය පාවිච්චි කිරීම ගතහොත් ගොවියාගේ හැසිරීම තීරණය කරන ලද මූලික ලක්ෂණ තුනක් ඇත. එනම් වාරිපද්ධතිය පිටස්තර සම්පතක් වීමත් ගොවියාගේ අභිමතාර්ථය අවශ්‍යයෙන්ම පෞද්ගලික වීමත් සහ වාරිජලය කිසියම් කෙත් ඇලක ගොවීන් විසින් පොදුවේ පාරිභෝජනය කිරීමට සිදුවීමත් ය. මේ තත්ත්වය උඩ පැහැදිලිව හඳුනාගත හැකි එක්තරා ලක්ෂණයක් වාරිපද්ධතියක් තුළ ඇතිවී තිබේ. එනම් එක් එක් ගොවියා විසින් වැඩි වැඩියෙන් පෞද්ගලික අභිමතාර්ථ මුදුන් පමුණුවා ගැනීමට තරඟ වැදීම නිසා වාරි පද්ධතියට ඇතිවී තිබෙන අහිතකර බලපෑමයි. වාරිජලය නාස්ති කිරීම, ගොවීන් අතර ආරාවුල්, වාරිමාර්ග නිර්මිත කඩා දැමීම ඇලවේලි නඩත්තු කිරීම නොසලකා හැරීම ආදී විවිධ අක්‍රමිකතා. ඉහත සඳහන් පසුබිම සහිත තරඟය නිසා ඇතිවූ තත්ත්වයකි. පිටට පෙනෙන මේ ගොවි හැසිරීම වාරිපද්ධතිය හා ගොවියා අතර ඇති දුරස්ථර සම්බන්ධය කියාපාන නිහඬ පණිවිඩයකි.

ගොවීහු තම පුද්ගලික අභිමතාර්ථ සඳහා සීමිත සම්පතක් බෙදා ගැනීමේ අරමුණ සහිතව, ඔවුනොවුන් කෙරෙහි තරඟවදිති. ගොවීන් අතර පවත්නා යම් යම් පෞද්ගලික වාදභේද, ඉම නියර අරගල, දේශපාලන මෙන්ම, කුල, ජාති හා පංතිභේද ආදී තත්ත්වයන් ප්‍රශ්නයේ ස්වභාවය තව තවත් සංකීර්ණ කර ඇත. නිලධාරීන්ගේ අඩුපාඩුකම්, නිලධාරීන් හා ගොවීන් අතර ඇති දුර්වල සම්බන්ධතාවන්, අක්‍රමිකතා, දූෂණ, වරින්වර වෙනස් වන හා දියවී යන සංවර්ධන ප්‍රතිපත්ති ආදියෙන් ගොවියන් ලැබූ නිසරු අත්දැකීම් ආදිය ඔවුන් තුළ ඇතිකර ඇත්තේ එතරම් හොඳ ආකල්ප නොවන බව ගොවීන් සමග කරන කෙටි සාකච්ඡාවකදී වුවද පෙනී යයි. එමෙන්ම වාරි ගොවීන්ගේ අඩු ආදායම්, අඩු අධ්‍යාපන තත්ත්වයන්, දුර්වල නායකත්වය හා ගොවීන් හෙම්බත් කළ ප්‍රජා සංවිධාන ආදිය වර්තමාන ගැටළුවෙන් මිදීමට ගොවීන්ට අනුබලයක් දෙන්නේද නැත.

පවත්නා මේ තත්ත්වය යටතේ එනම් ගොවියාගේ වර්තමාන හැසිරීම නින්දු කල මුලින් දැක්වූ මූලික සාධක සහ අප ඉදිරිපත් කළ සමාජ ආර්ථික සංකීර්ණත්වයන් එසේම පවතිද්දී වාරිපද්ධතිය ඔබගේ එය ආරක්ෂා කිරීම ඔබ සතු යයි කියා ගොවි හැසිරීම හා ආකල්ප වෙනස් කිරීමට කටයුතු කිරීම අද අපේ මූලික කාර්යය වී ඇත. එහෙත් ගොවි හැසිරීම හා ආකල්පවලට පදනම්වූ තත්ත්වයන් වෙනස් වී නැති නිසා මේ ව්‍යාපාරය හුදෙක් ප්‍රචාරක ව්‍යාපාරයක් විනා සැබෑ පරිවර්තනයක් කිරීමට සමත් වේ යයි සැලකිය නොහැකිය. ගොවියාත් වාරි පද්ධතියත් අතර කිට්ටු සම්බන්ධතාවයක් ඇති කිරීමටත්, ගොවියා තුළින්ම පද්ධති ආරක්ෂා කිරීමටත්, අවශ්‍ය වේ නම් මේ සඳහා ගැලපෙන මූලික ප්‍රතිපත්ති සම්පාදනය කළයුතු වේ. මේ අනුව වාරි සැලසුම්කරණය, නිර්මාණකරණය, නඩත්තුව තීරණ ගැනීම, කළමණාකරණය ආදී විවිධ අංශවල ගොවි සහභාගිත්වය නියෝජනය විය යුතු අතර එනම් හුදෙක් උඩින් එන විධානයකට යටත්වීමකට වඩා පහළ මට්ටමේ අවශ්‍යතාවයක් වශයෙන් එළිදැකීමද අවශ්‍ය වේ. තවදුරටත් පැහැදිලි කරතොත් ගොවි හැසිරීම් රටාව හා ආකල්ප යහපත් මාර්ගයකට යොමු කිරීමට නම් එක් අතකින් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය විය යුතුය.

අනෙක් අතින් මේ සඳහා පහළ මට්ටමේ සිට ගොවීන් සූදානම් කළ යුතුය. පුහුණු කළ යුතුය. පෙළගැන්වීමක් හා පෙලඹවීමක් කළ යුතුය. මේ ද්විත්ව අවශ්‍යතාවන් යම් අවස්ථාවක සම්පූර්ණ වේද, එවිට ගොවීන් වාරි පද්ධතිය ඔහුගේ යයි හඟිනු ඇත. ඔවුන් එය ආරක්ෂාකිරීමටත් සංවර්ධනය කිරීමටත් ස්වේච්ඡාවෙන් උනන්දු වනු ඇත.